# පොත් පත් පුවත්

## සිව් වසරක් මරදානේ
රසික සූරියආරච්චි

*ප්‍රකාශනය - දයාවංශ ජයකොඩි සහ සමාගම*

# කතන්දරකාරයාගේ අතීතාවර්ජනය

## රසික සූරියආරච්චිගේ නිර්මාණ දිවියේ මං සළකුණක්

## සිව් වසරක් මරදානේ

ජගත් ජේ එදිරිසිංහ

විත්ති කතා වැදගත් සාහිත්‍යාංගයකි. ලේඛකයාගේ පුද්ගලික අත්දැකීම් හෝ ලේඛකයා දකින සමාජමය අත්දැකීම් හෝ පාඨකයා වෙත ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කිරීම විත්ති කතා වලදී සිදුවෙයි. ලේඛකයා තෝරා ගත් කාලවකවානුවේ සමාජ හා දේශපාලන පසුබිම පිළිබඳ අධ්‍යයනයක්ද නිරායාසයෙන් මේ කතා තුළින් සිදුවෙයි. එනිසාම සාමාන්‍ය සාහිත්‍ය නිර්මාණයකදී අප අත්නොවිඳින වෙනස්ම ආකාරයක වින්දනයක් ද විත්ති කතා අපට ගෙනදෙයි. ප්‍රවීණ ලේඛක රසික සූරියආරච්චි ගේ සිව් වසරක් මරදානේ කෘතිය ද විත්ති කතා මාලාවක් ලෙස වර්ග කරන්නට මම කැමැත්තෙමි.

සිව් වසරක් මරදානේ ලේඛකයා තමාගේ බාලවියේ මරදානේ ආනන්ද විද්‍යාලයයේ ගත කළ යුගයේ අත්දැකීම් පාඨකයා සමග බෙදා හදා ගන්නට ගත් උත්සාහයකි. එහෙත් ඒ ලේඛණය හුදෙක් වාර්තාවක් බවට පත් නොකර පාඨකයාගේ සිතේ කිසියම් ආකරයක භාවමය කම්පනයක් ඇති කරන්නට රසික සමත් වී ඇතැයි මට සිතෙයි. එය රසික සූරියආරච්චි නම් වන ලේඛකයාගේ - සූර කතාකාරයාගේ - දක්ෂතාවයි.

ප්‍රවීණ ලේඛක ඩී බී කුරුප්පු මහතා සමගින් මම වතාවක් රසිකගේ නිර්මාණ පිළිබඳව කතා කරමින් සිටියෙමි.

"මේ හාදයා හරිම දක්ෂ කතාකාරයෙක්.." කුරුප්පු මහතා නිර්ලෝභී ලෙස කී හැටි මට මතක ය. මම ඔහු හා සියයට සියයක්ම එකඟ වෙමි. රසික අතිදක්ෂ කතාකාරයෙකි.

තමා අත්දකින ඉතා සුලු සිදුවීමක් පවා කතාවක් බවට පෙරළන්නට සූර කතාකාරයෙකුට හැකි ය. මතුපිටින් සරළව පෙනුණ ද එය හැමටම කළ හැකි හපන්කමක් නොවේ. කතාකාරයා පළමුව කතාවක් බවට පෙරළිය හැකි අත්දැකීම හඳුනාගත යුතුය. ඉන්පසු ඒ අත්දැකීම පාඨකයා ගේ සිත ඇදගන්නා ආකාරයට ඉදිරිපත් කළ හැකිවන්නේ කෙසේදැයි ඔහු කල්පනා කළ යුතු ය. යොදාගත යුතු බස කතාවේ සැඟවිය යුතු රසය - උපහාසය, සතුට, දුක, කෝපය - ඔහු හඳුනාගත යුතු ය. මේ සියල්ල එක්තැන් වූ කල කතාකාරයා බිහිවෙයි. රසික එවන් කතාකාරයෙකි.

සෑම මිනිසකුගේම ජීවන කතාව තුළ කතාකාරයකුට අහුලාගත හැකි අද්දැකීම් අනන්තවත් ඇත . මිනිසකුගේ හපන්කම් මෝඩකම් තුළින් උකහාගත හැකි ජීවන සත්තාව තේරුම් ගන්නා විට ඒ කතා වලට පෙම් බඳින්නට අපට හැකි ය. ඒ කතා හුදු පුරසාරම් වලට ලඝු නොකර ඒ තුළ ගැබ්වුණ ජීවන සුවඳ උකහා ගන්නේ නම් එය අපේ ජීවන දර්ශනයේ ද පරිකල්පනයේද වෙනසක් කරනු නොඅනුමාන ය.

තමන්ගේ ජීවිතය දෙස ආපසු හැරී බලා තමා අත්විඳි සිදුවීම් ඔස්සේ තමාමට සිනාසෙන්නට රසිකට හැකි ය. තමාගේ හිතවතුන්ගේ අත්දැකීම් දෙස උපහාසයෙන් බලන්නට අනුකම්පාවෙන් බලන්නට අභිමානයකින් සිතන්නට රසිකට හැකිය. ඒ සියල්ල කතාබවට පෙරළා අප තුළ රසභාව ජනිත කරන්නටද ඔහුට හැකිය. රසික ගේ කතා කියවන විට අපට ඒ බව මැනැවින් පසක් වෙයි.

ඩ්‍රැකිව්ලාගේ මනාලියෝ, මොන්තො ක්‍රිස්ටෝ සිටුවරයා., කම්මැලි මකුණෝ, කොට කලිසම් කාරයෝ, බිත්තර පාන් නොකාපාන්, නීච ළමයි, මෙදා පොටේ දුන්න බැටේ, කොළඹට කිරි, සුද්දට පාර කියූ හැටි, විලයනයේ ගුප්ත තාපය, පෙස්සංකාරයා, හිඟන්නා සහ පාන් කාල, පන්සිල් ගත් අන්තිම දා, වෙනුරගේ කැල්කියුලේටරය, හාෆ් ෂීට් ගොඩ(ගේ), ශිෂ්‍ය නායකයෝ සහ ශිෂ්‍ය ලොක්කෝ, ජූඩෝ පන්තිය, ගණං ෆේල්ද, ආදර රෝගය, සෙකයුරිටි ජොබ් කට්ට, නිරුවත් රූමතියෝ, අම්මා ඇඬූ දා, අම්මා සිනාසුණා ය යන කතා වලින් සිව් වසරක් මරදානේ පොත සමන්විත වෙයි.

රසික ගේ බව රසවත් ය. නිරවුල් ය. වියරණ නොබිඳ කෙරෙන මේ රචනය කියවීම ප්‍රසන්න අත්දැකීමකි. තමා ලියන බස පිළිබඳ රසික දක්වන සැළකිල්ල පැසසුම් කටයුතු ය.

රසික ගේ මේ අතීතාවර්ජනය කියවන විට එය අපේම අද්දැකීමක් සේ අපට සමීප වෙයි. සමාජ අසාධාරණය දුප්පත් කම අපි ද අපේ පාසල් දිවියේ අත්දැක නැත්තෙමු ද? "කොට කලිසම්කාරයා" කතාවේ එන මේ කොටස බලන්න.




"අසුනෙන් නැගිට සිටගත් මේ උස මහත සිසුවා දුටු සැණෙන් ඔහු කොට කලිසමකින් සැරසී සිටි නිසාදෝ ඇය ගේ මුවට සිනාවක් නැගුණි. පාඩමට අදාල නොවන දේ කියා බාදා කිරීම ගැන සුනෙත් ට දොස් පවරද්දී ඇගේ මුවින් " ඇවිත් මෙතන ජංගි කොටයක් ඇඳගෙන" වැනි වදන් කිහිපයක් පිටවිය.

සුනෙත් ගේ නිර්භය කම අසාධාරණය නොඉවසීමේ ගතිම මා ඉතා හොඳින් දුටුවේ එදා ය.

"ටීචර් අපේ දුප්පත් කම ගැන ඔහොම හිනාවෙන් එක හරිද?" ඔහු අසා සිටියේ ය. "අපේ දෙමව්පියන් දුප්පත් නිසා අපි අපට තියෙන විදියට කොට කලිසමක් හරි ඇඳගෙන ඉස්කෝලෙ එනව. දුප්පත් වීම වරදක්ද ටීචර්?" ඔහු ප්‍රශ්න කළේ සේනානායක ගුරුවරිය තුෂ්නිම්භූත කරමිනි."

රසික කතාව අවසන් කරන්නේ කොටකලිසම්කාරයා එක්සත් ජනපද හමුදාවට බැඳී ඉහළටම ගිය බව කියමින් ය.

දිගින් දිගටම බොහෝ උදාහරණ දැක්විය හැකි වුවත් උපහාස රසය කුළුගැන්වෙන අයුරින් රසික සිය බස හසුරුවන ආකාරය විදහා දක්වන "සුද්දට පාර කියූ හැටි" කතාවේ එන මේ උපුටාගැන්ම බලන්න.

"අයි ඩෝන්ට් නෝ"

මුහුණ බෙරි කරගත් සුද්දා ඉවතට ඇදී ගියේ ය. ඔහු හිතන්නට ඇත්තේ මා කියුවේ "ටවුන් හෝල් 2 නොහොත් පුරහලට යන අයුරු මා නොදන්නවාය කියා විය යුතු ය. නමුත් මා ඇත්තටම කීවේ පුරහලට යන මාර්ගය ඉංගිරිසියෙන් විස්තර කර පවසන්නට මා නොදන්නා බව පමණි.

රසික මේ කතා සන්නස පුවත්පතට ලිව්වේ ඔහුගේ "පමා නොවී එම් අකුරට" කොළමට ය. එය ඉතා රසවත් සහ ජනප්‍රිය කොළමක් විය. ඒ පිළිබඳ අප ලද ප්‍රතිචාරද අපමණ විය. රසික සිය කොළම ඔස්සේ කියන දේ නිසි ලෙස අවබෝධ කර නොගෙන "උඹ අපේ ඉස්කෝලෙට හිනා වෙනවා" යි කියා රසිකට ගල් විසි කළ අය ද සිටිය හ. රසික ලියන්නේ සමාජය ගැන ය. පාසලක් ඇතුළත ඇත්තේද සමස්ථ සමාජයේම ස්වරූපය ගත් කුඩා කුලකයකි. කුරුවල් වූ සමාජයක හොඳ නරක සියල්ලේම හැඩ තල පාසලක් තුළද නිරීක්ෂණය කළ හැකි වීම ඒ පාසලේ වරදක් නොවේ. සමස්ථ සමාජයේම වරදකි. ඉංජිනේරුවෝ දොස්තරවරු පමණක් නොව පාදඩයෝ මිනීමරුවෝ මංකොල්ලකාරයෝ ද මේ අති පූජනීය යයි සමහරු අදහන ආයතන තුළින් ම බිහිවෙති. පගා ගසා වරදකරුවන් වූ විදුහල්පතිවරු පවා බිහිවෙති. රසික ඒ සත්‍යය මැනැවින් තේරුම් ගෙන සිටි බව මම දනිමි. ඔහු විවේචකයන්ට සිනාවකින් පමණක් ප්‍රතිඋත්තර දුන්නේ එනිසා ය.

***රසික ලියන්නේ සමාජය ගැන ය. පාසලක් ඇතුළත ඇත්තේද සමස්ථ සමාජයේම ස්වරූපය ගත් කුඩා කුලකයකි. කුරුවල් වූ සමාජයක හොඳ නරක සියල්ලේම හැඩ තල පාසලක් තුළද නිරීක්ෂණය කළ හැකි වීම ඒ පාසලේ වරදක් නොවේ. සමස්ථ සමාජයේම වරදකි.***

රසික සූරියආරච්චි ප්‍රතිභාන්විත ලේඛකයෙකි. කවියකු කෙටිකතාකරුවකු ලෙස අපේ ගෞරවයට පාත්‍රව සිටින රසික "කතන්දර" බ්ලොග් අඩවියේ කතන්දරකාරයාය. ඔහු එහි "කකා" ලෙස ලියමින් සිටින කතන්දර, "සිව් වසරක් මරදානේ" කෘතියේ කතන්දර හා සසඳන කල මේ දෙකම ලියන්නේ එකම ලේඛකයාදැයි විමතියක් ඇතිවන තරම් ය. කතන්දර බ්ලොග් අඩවියේ රසික ලියන කතා, බ්ලොග් සමාජයේ "එල ... එල .." ප්‍රතිචාර බලාගෙන ස්වයංවින්දනයකට පත්වීම උදෙසා කෙරෙන්නක්ද?

"අනේ බං අයියේ අර රසික අයියට මොකද වෙලා තියෙන්නෙ..? අපරාදෙ.." පසුගිය වකවානුවේ ලංකාවට ගිය දවසක ශ්‍රී ලංකාවේ නිර්මාණ ක්ෂේත්‍රයේ ඉහළින්ම සිටින තරුණ ලේඛිකාවක මගෙන් ඇසූ පළමු ප්‍රශ්නය එය විය. නිර්මාණකරුවකු ලෙස රසිකට ආදරය කරන ඇය සිය ප්‍රශ්නයට ප්‍රස්තුත කරගත්තේ කතන්දර බ්ලොග් අඩවිය ය. ලේඛකයකු ලෙස රසිකට ඇති දීර්ඝ ගමන් මග හරස්කරගෙන බ්ලොග් අඩවියක් නැගී සිටීම තේරුම් ගෙන ඇත්තේ මා පමණක් නොවන බව මම දැන් දනිමි. එය රසික ද

